**කැන්විල් හෝල්ඩින් (පුද්ගලික) සමාගම - 2021**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

කැන්විල් හෝල්ඩින් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2021 දෙසැම්බර් 31 දිනට,සමාගමේ සහ පරිපාලිතයන්හි (සමූහය) ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**අවධාරණය කරණු ලබන කරුණු**

මගේ මතයට බලපෑමක් සිදු නොකර, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය, මූල්‍ය ප්‍රකාශන වල 2.5 සටහන වෙත අවධානය යොමු කරමි.එම සටහනේ දක්වා ඇති පරිදි, සමාගමේ කළමනාකාරිත්වය සමාගමට සහ එහි අනුබද්ධිත සමාගම්වල අඛණ්ඩ පැවැත්ම පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර අපේක්ෂා කළ හැකි නුදුරු අනාගතයේ දී ව්‍යාපාර කරගෙන යාමට අවශ්‍ය සම්පත් තමන් සතුව ඇති බවට සෑහීමකට පත්වේ. තවද, සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් කළමනාකාරිත්වය හඳුනාගෙන නැත.එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කර ඇත.

කෙසේ වෙතත් හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 වර්ෂයේ දී හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අත්හිටුවීමට තීරණය කර ඇත.එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ හෝටල් ඉදිකිරීම් කටයුතු අවසන් වී ඇත.තවද, රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය විසින් 2017 අගෝස්තු 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කැන්විල් හෝල්ඩින් (පුද්ගලික) සමාගමේ (මව් සමාගම) හිමිකාරිත්වයට සමානුපාතිකව, සමාගමේ කොටස් එහි කොටස් හිමියන්ට පැවරීමට උපදෙස් ලබා දී ඇත.වාර්තා කරන දිනට, මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නැත. සමාගම නුදුරු අනාගත කාලයේදී ඈවර කිරීමට තීරණය කර නොමැති අතර සමාගමේ කළමනාකාරිත්වය ඉදිරි ගමනේදී රේඛීය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගනී. ඒ් අනුව, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කර ඇත.

තවද, සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ හි කළමනාකාරීත්වය සමාගමට අඛණ්ඩව ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර නුදුරු අනාගතයේදී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය සම්පත් තමන් සතුව ඇති බවට සෑහීමකට පත් වේ.තවද, සමාගමට අඛණ්ඩව පැවැත්ම පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිෂ්චිතතාවයක් කළමණාකරණය හඳුනාගෙන නැත.මීට අමතරව, 2020 ජුලි 08 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ග්‍රෑන්ඩ් හයට් කලම්බු ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.ඒ අනුව, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේදී නැවත ආරම්භ කර ඇත.තවදුරටත් 2022 ජනවාරි 03 දිනැති අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි, සමාගමේ කළමනාකාරිත්වය විසින් ඩොල ර් මිලියන 25 ක කොටස් සහ ඩොලර් මිලියන 150 ක ණය ප්‍රාග්ධනය මගින් ඩොලර්. මිලියන 175 ක ව්‍යාපෘති මූල්‍යනය කටයුතු සැකසීමට කටයුතු කරමින් සිටී.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මගේ නිගමන පදනම් වී ඇත්තේ මගේ විගණක වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මතය.කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ (පරිපාලිත) හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අත්හිටුවීමට තීරණය කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමේ හෝටල් ඉදිකිරීම් කටයුතු අවසන් වී ඇත. තවද, රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය විසින් 2017 අගෝස්තු 01 දිනැති අංක 17/1613/733/029 දරන අමාත්‍ය මණ්ඩල | 2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය විසින් සමාගමේ හිමිකාරිත්වය ප්‍රතිව්‍යුහගත කිරීමට ගත් තීරණය වාර්තා කරන ලද දිනට ක්‍රියාත්මක කර නොමැත.<br><br>කෙසේ වෙතත්, සමාගමේ වත්මන් කළමනාකාරිත්වය ව්‍යාපෘතියේ සහ සමාගමේ ඉදිරි ගමන පිළිබඳව රේඛීය අමාත්‍යාංශයෙන් අවශ්‍ය මගපෙන්වීම අපේක්ෂා කරනු ලැබේ . | ව්‍යාපෘතියේ අනාගත මග පෙන්වීම සඳහා කළමනාකාරීත්වය යෝග්‍ය අධිකාරිය සමඟ සම්බන්ධීකරණය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| තීරණයට අනුව හිමිකාරිත්වයට සමානුපාතිකව සමාගමේ කොටස් එහි කොටස් හිමියන්ට පැවරීමට උපදෙස් ලබා දී ඇත.වාර්තා කරන දිනට, හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමෙහි සමාගම සතු කොටස් පැවරීම ස්වාධීන තක්සේරුවක් මත පදනම් විය යුතුය.<br>එබැවින්, නුදුරු අනාගත කාලයේදී සමාගම ඇවර කිරීමට සමාගම තීරණය කර නැත.ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත සකස් කර ඇත. | ඉදිරි ගමන පිළිබඳ උපදෙස් ඉල්ලා , 2022 සැප්තැම්බර් 01 දින රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට නීතිමය මත දෙකක් ඉදිරිපත් කර ඇති අතර තත්ත්වය එලෙසම පවතී. අපගේ ලිපිය මත පදනම්ව ඉදිරි ගමන පිළිබඳව අපි උපදෙස් බලාපොරොත්තුවෙන් සිටිමු. | |
| සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ (පරිපාලිත) හි කළමනාකාරීත්වය සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර නුදුරු අනාගතයේ දී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය සම්පත් තමන් සතුව ඇති බවට සෑහීමකට පත්වේ. තවද, සමාගමට අඛණ්ඩව පැවැත්ම පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් කළමනාකරණය හඳුනාගෙන නැත. මීට අමතරව, 2020 ජුලි 08 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ග්‍රෑන්ඩ් හයට් කලම්බු ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.ඒ අනුව, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේදී නැවත ආරම්භ කරන ලද අතර වාර්තා කරන දිනට ක්‍රියාත්මක වෙමින් පවතී. කෙසේ වෙතත්, මූල්‍ය හිඟය හේතුවෙන් රජය සහ මව් සමාගම විසින් මූල්‍යමය වශයෙන් සහය දක්වා ඇත.කෙසේ වෙතත්, ව්‍යාපෘතිය දිගටම කරගෙන යාමට රජයේ හෝ මව් සමාගමේ සහාය සහ උපදෙස් අවශ්‍ය වේ. | අමාත්‍ය මණ්ඩලය විසින් පූර්ණ විසර්ජන තීරණයකට එළැඹෙන තෙක් කොටස් ආයෝජනය රු බිලියන .6 ක් වූ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අරමුදල් සම්පාදනය කරන ලෙස නියෝග කර ඇත .(යොමු:2020 ජුලි 08 දිනැති 20/1042/204/050-1 2020.(ඒ අනුව නිසි මූල්‍ය වැඩසටහනක් හරහා අවශ්‍ය ශේෂ මූල්‍ය සම්පාදනය කරන තෙක් ව්‍යාපෘතියේ ඉදිකිරීම් අඛණ්ඩව කරගෙන යාමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් පළමු වාරිකය ලෙස රුපියල් බිලියන 2 ක මුදලක් 2021 මැයි මස හිමිකම් නිකුතුවක් මගින් ලබා දී ඇත.<br><br>2007 අංක 7 දරන සමාගම් පනතේ 31(1) වගන්තිය යටතේ ක්‍රියාත්මක වන සාමාන්‍ය කොටස් නිකුතුව 2021 ජුනි 10 වන දින නිකුත් කිරීම සඳහා සියලුම කොටස් හිමියන් විසින් අත්සන් කරන ලද සහ විශේෂයෙන් ඒකමතිකව නිකුත් කිරීමට එකඟ වූ ,කොටස් හිමියන්ගේ ගිවිසුමට අනුව, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට සාමාන්‍ය කොටස් නිකුත් කිරීම මගින් 2 වැනි වාරිකය ලෙස රුපියල් බිලියන 2 ක් බලාපොරොත්තු විය.කෙසේ වෙතත් වාර්තා කරන දිනට සලකා බැලීම බලාපොරොත්තු වේ.අමාත්‍ය මණ්ඩලය විසින් නියම කර ඇති පරිදි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රුපියල් බිලියන 6 ක අරමුදල අපේක්ෂාවෙන් මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත.කෙසේ වෙතත්, ව්‍යාපෘතියට බලපාන රු. බිලියන 4 තවමත් ලැබී නොමැති අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ නියාමන ගිවිසුම් හේතුවෙන් ව්‍යාපෘතියට අරමුදල් සැපයීම | ව්‍යාපෘතියේ අනාගත මග පෙන්වීම සඳහා කළමනාකාරීත්වය යෝග්‍ය අධිකාරිය සමඟ සම්බන්ධීකරණය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

පිළිබඳව බාධා ඇති බව දන්වා ඇත.(පශ්චාත් විගණනය 2021 දෙසැම්බර් 31).
ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා කොටස් හා ණය වශයෙන් ඩොලර් මිලියන 175ක් යෙදවීමේ වැඩසටහනක් සඳහා සමාගම කටයුතු කරමින් සිටී.

තවද, 2022 ජනවාරි 01 දිනැති අංක 21/2278/306/100 දරන අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත පදනම්ව, සමාගමේ කළමනාකාරිත්වය විසින් ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා ඇ.ඩො.මිලියන 25 කොටස් සහ ඇ.ඩො.මිලියන 150 ණය ප්‍රාග්ධනය ලෙස ඇ.ඩො.මිලියන 175 ක යෙදවීමට කටයුතු කරමින් සිටී.

තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියකින් පසු, කැනඩාවේ Netwyn Solutions හි ආයෝජන පහසුකම් සපයන සමාගමක් සහ කැනඩාවේ L.A. Capital Inc. (LAC) වෙත ග්‍රෑන්ඩ් හයට් කලම්බු හි ඉතිරි ඉදිකිරීම් කටයුතු සඳහා කොටස් ප්‍රාග්ධනය වශයෙන් ඇ.ඩො.මිලියන 25 ක් සහ ණය ප්‍රාග්ධනය ඇ.ඩො. මිලියන 150 ක් ලෙස ඩොලර් මිලියන 175ක් මූල්‍යකරණය කිරීම අනිවාර්ය කරන ලදී. එම සමාගමේ නිලධාරීන් 2022 මාර්තු 21 වැනි දින ශ්‍රී ලංකාවට පැමිණ ඔවුන්ගේ කටයුතු වල නිරත වූහ. ශ්‍රී ලංකාව තුළ අත්විඳින වත්මන් අහිතකර ආර්ථික පරිසරය සහ රට තුළ පවතින අහිතකර ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් සහ ස්වෛරී ණය අර්බුදය හේතුවෙන් තම ආයෝජනය හා සම්බන්ධ අවදානම පිළිබඳව දැඩි අවධානයෙන් පසුවන බව ඔවුන් ප්‍රකාශ කර ඇත.තවද 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව ණය පැහැර හැරීම් තත්ත්වය නිවේදනය මත පදනම්ව, ඉදිරියේදී , පොලී අනුපාතය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අතිරේක ආයතනික ඇපකරය සහ අරමුදල් බෙදා හැරීමේ ක්‍රියා පටිපාටිය වැනි මුලින් එකඟ වූ කොන්දේසි සමඟ වැඩ කිරීමට නොහැකි වනු ඇති බව ඔවුන් පවසා ඇත. (එක්වර ඩොලර් මිලියන 175ක් ලබා නොදීම සහ යනාදිය). කෙසේ වෙතත්, කාලය ඉකුත්වීම මත ගිවිසුම අවසන් වූ අතර, එමඟින් ප්‍රාග්ධනය රැස් කිරීම සඳහා තවදුරටත්

තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන ලද අතර එය ද ක්‍රියාත්මක කිරීමට අසමත් විය.

ඉහත තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, කලමණාකාරිත්වය ව්‍යාපෘතියේ ඉදිරි ගමන පිළිබඳව මුදල් හා භාණ්ඩාගාර අමාත්‍යාංශයේ උපදෙස් බලාපොරොත්තුවෙන් සිටියි.

අද වන විට ව්‍යාපෘතියට පුනරාවර්තන වියදම් කළමනාකරණය කිරීමට, සම්පූර්ණ කරන ලද වැඩ නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම සහ 2022 දෙසැම්බර් දක්වා වැටුප් ගෙවීම සඳහා අරමුදල් සීමිත වී ඇත. කලමණාකාරිත්වය, රේඛීය අමාත්‍යාංශයෙන් 100% වෙන් කිරීම පිළිබඳ නියෝගයක් ලබා ගැනීමට බොහෝ ඉල්ලීම් කර ඇත.

2022 ඔක්තෝම්බර් 13 දිනැති:SNHS/2022/21 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ට අනුව සහ 2022 ඔක්තෝබර් 20 දිනැති 2022-14-අංක 5 දරන අධ්‍යක්ෂ මණ්ඩල සටහන් අනුව ග්‍රෑන්ඩ් හයට් ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය විස්තරාත්මකව සාකච්ඡා කරයි.
වත්මන් අසීරු ආර්ථික පසුබිම, පිරිහෙමින් පවතින මුදල් ප්‍රවාහ තත්ත්වය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් අරමුදල් ලබා නොදීම සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමත විකල්ප ණය/කොටස් අරමුදල් සම්පාදනය ඉදිරියට නොයෑම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලීමට ඒකමතිකව තීරණය කර ඇත.
නොවිසඳුණු වගකීම් වලින් තවදුරටත් සමාගමට වන වියදම් වළක්වා ගැනීම සඳහා හැකි ඉක්මනින් 100% වෙන්කිරීමක් කරගෙන යාමට කැබිනට් අනුමැතිය බලාපොරොත්තු වේ.

## 2. මූල්‍ය සමාලෝචන

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ විවේක අංශයේ ආයෝජන ප්‍රවර්ධනය සහ සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම සහ හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම අනුබද්ධ සමාගම් ලෙස පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීමයි.

සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමෙහි ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ දැනට ඉදිවෙමින් පවතින ග්‍රෑන්ඩ් හයට් කලම්බු හි අයිතිය සහිතව සත්කාරක වෙළෙඳ ව්‍යාපාරයේ නිරත වීමයි.

හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමෙහි ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ හයට් රිජන්සි හම්බන්තොට හෝටලයෙහි අයිතිය සහිතව සත්කාරක වෙළෙඳ ව්‍යාපාරයේ නිරත වීමයි. කෙසේ වෙතත්, හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 වර්ෂයේදී හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය නවතා දැමීමටය තීරණය කර ඇත. වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) හි ඉදිරි ගමන පිලිබඳව මුදල් අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට බලාපොරොත්තු වේ.

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 5,008,966 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු. 4,076,470. ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 932,436 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මූල්‍ය ආදායමේ වැඩි වීම හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පසුගිය වසර පහ තුළ ආදායම්, පරිපාලන වියදම් සහ ශුද්ධ ලාභය/අලාභය පහත පරිදි විය.

| අනුපාතය | 2021 | 2020 | 2019 | 2018 | 2017 |
|---|---|---|---|---|---|
| මූල්‍ය ආදායමේ වැඩි වීම/(අඩුවීම). | 1206% | (87%) | (63%) | (33%) | 170% |
| පරිපාලන වියදම් වැඩි වීම /(අඩු වීම). | 44% | (34%) | 14% | 11% | (5%) |
| ශුද්ධ ලාභය වැඩි වීම /(අඩු වීම). | (223%) | 1,498% | (101%) | (89%) | 161% |

## 2.3 අනුපාත විශ්ලේෂණය

මූල්‍ය ප්‍රකාශන සහ විගණනය සඳහා ලබා දී ඇති තොරතුරු අනුව, පෙර වසර හා සසඳන විට සමාලෝචිත වර්ෂය සඳහා වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| වර්ෂය | 2021<br>රු. | 2020<br>රු. | 2019<br>රු. | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|---|---|
| මූල්‍ය ආදායම | 16,009,682 | 1,225,668 | 9,435,080 | 25,564,060 | 38,088,317 |
| පරිපාලන වියදම් | (9,411,210) | (6,540,697) | (9,931,740) | (8,725,269) | (7,869,756) |
| බදු පසු ශුද්ධ ලාභය/(අලාභය) | 5,008,966 | (4,076,470) | (255,178) | 18,477,650 | 165,373,105 |

## 3. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 5.1 පරිච්ඡේදයට අනුව, ආයතනය සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීමට සමාගමට දැනට භාර දී ඇති අතර ව්‍යාපෘති අවසන් කිරීමේ සැලැස්ම අවශ්‍ය පරිදි සංයුක්ත සැලැස්මක් ලෙස දීර්ඝ කිරීමට නියමිතය. | සමාගම සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | ව්‍යාපෘතිය අවසන් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාත්මකයි. | සමාගම සිය වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී /12 හි 3.7.5 වගන්තියට අනුව, මෙහෙයුම් සත්‍ය සහ සාධාරණ ලෙස සිදු කිරීම සහතික කිරීම සඳහා පද්ධති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීමට අභ්‍යන්තර විගණන කළමනාකරු වගකිව යුතුය. නමුත් ආයතනයේ අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යභාරය, ගෙවීම් පිළිබඳ පූර්ව විගණනයක් සිදු කිරීමට සහ බිල්පත්/ගෙවීම් වවුචර සහතික කිරීමට සීමා කර ඇත. | 2015 වසරේ සිට ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි අනුගමනය කරමින් කාලීන අභ්‍යන්තර විගණන කාර්යය වරලත් ගණකාධිකාරී සමාගමකට පවරා ඇත. ඔවුන් 2018 ජුනි 30 දින දක්වා කාර්තුමය වාර්තා විගණන කමිටුවට ඉදිරිපත් කර ඇත. ඔවුන් 2019 සහ 2020 වසර සඳහා පත්කරන ලද නමුත්, ඉදිකිරීම් කටයුතු අත්හිටුවීම සහ පසුව ඇති වූ කොවිඩ් 19 සීමා කිරීම් හේතුවෙන් අභ්‍යන්තර විගණනය සඳහා කැඳවීම් නොකරන ලදී .<br>2022 වසරේ සිට අභ්‍යන්තර විගණන කටයුතු බාහිරින් ලබා ගැනීම සැලසුම් කර ඇත.<br>අභ්‍යන්තර විගණන කළමනාකරු විසින් ප්‍රධාන කරුණු විගණන කමිටුවේ අවධානයට යොමු කර ඇත. | ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඵලදායී කළමනාකරණ මෙවලමක් ලෙස සමාගම සඳහා අභ්‍යන්තර විගණනය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය. |

## 3.4 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 12 හි 7.4.1 වගන්තියට අනුව, කළමණාකරණ කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක්වත් නිතිපතා රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත මුදල් වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම පවත්වා තිබුණේ එක් අවස්ථාවක් පමණි. | රට වසා දැමීම හේතුවෙන් රැස්වීම් සීමා කිරීම නිසා විගණන කමිටු රැස්වීම් නිතිපතා පැවැත්වීමට නොහැකි විය. 2022 වර්ෂයේදී මේ සඳහා දැඩි ලෙස අනුගතව කටයුතු කරනු ලැබේ. | අදාළ නීති රෙගුලාසි සහ පරිචයන්ට අනුකූලව විගණන කමිටුවේ ඵලදායී ක්‍රියාකාරීත්වය අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සහතික කළ යුතුය. |

## 3.5 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දින පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 5.2 වගන්තියට අනුව, ආයතනය විසින් සමාලෝචිත මුදල් වර්ෂය සඳහා වාර්ෂික අයවැයක් සකස් කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | කළමනාකරණයට සමාගමේ වියදම් පිළිබඳ නිසි පාලනයක් සිදුකල හැකිවන පරිදි ඵලදායී අයවැය පාලනයක් සමාගම තුළ පවතින බව අධ්‍යක්ෂක මණ්ඩලය සහතික කළ යුතුය. |